# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2314/88 – 2023 ජනවාරි 14 වැනි සෙනසුරාදා – 2023.01.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/2019/191.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2022.07.11 වන දින අංක 2288/07 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2022.06.27 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

කේ. කේ. ඩබ්. ආර්. කාරියවසම් මයා, ලිහිණියාව, මහ කළුපහන, මතුගම.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ලංකා ඉලෙක්ට්‍රිසිටි කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්, ඊ. එච්. කුරේ ගොඩනැගිල්ල, අංක 411, ගාලු පාර, කොළඹ 03.

අතර පවත්නා 2022.06.17 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් නීතිඥ එල්. ඩී. ටී. රාජපක්ෂ මයා වෙත යොමු කරන ලදී.

බේරුම්කරු නීතිඥ එල්. ඩී. ටී. රාජපක්ෂ මයා ධුරයෙන් ඉල්ලා අස්වන බව දන්වා ඇත. එබැවින් යථෝක්ත නියෝගය, අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මා, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2022.06.27 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

මනූෂ නානායක්කාර,
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2023 ජනවාරි මස 05 වැනි දින,
කොළඹ දී ය.


1A – G 38580 – 19 (2023/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/03/2019/191.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල් වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

කේ. කේ. ඩබ්. ආර්. කාරියවසම් මයා, ලිහිණියාව, මහ කළුපහන, මතුගම.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ලංකා ඉලෙක්ට්‍රිසිටි කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්, ඊ. එච්. කුරේ ගොඩනැගිල්ල, අංක 411, ගාලු පාර, කොළඹ 03.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බත්තරමුල්ල, පැලවත්ත, සිංහපුර පාර, 117, සිරි සිංගප්පුලි මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2023 ජනවාරි මස 05 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/03/2019/191.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

කේ. කේ. ඩබ්. ආර්. කාරියවසම් මයා, ලිහිණියාව, මහ කළුපහන, මතුගම.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ලංකා ඉලෙක්ට්‍රිසිටි කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්, ඊ. එච්. කුරේ ගොඩනැගිල්ල, අංක 411, ගාලු පාර, කොළඹ 03.

**ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

"කේ. කේ. ඩබ්. ආර්. කාරියවසම් මහතාට ආදායම් නිලධාරි තනතුර හිමි ද, හිමි නම් ඒ කවර කාලයක සිට ද? හිමිවිය යුතු සහන කවරේද යන්නත්, සහ 2001.01.01 දින සිට iii ශ්‍රේණියේ ආදායම් නිලධාරි තනතුරට පත් කිරීමෙන් කේ. කේ. ඩබ්. ආර්. කාරියවසම් මහතාට එම පත්වීම ශ්‍රේණිගතව ලබා දීමෙන් අසාධාරණයක් සිදුව තිබේ ද? එසේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේ ද? යන්නත් පිළිබඳව වේ",

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 දෙසැම්බර් මස 28 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 01 - 0138

මගේ අංකය: IR/COM/01/2018/121.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2022.06.18 වන දින අංක 2284/65 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2022.06.08 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

01. ඒ. එල්. විජේසුන්දර මයා, නො. 130 බී, යාලගල පාර, හොරණ.
02. එස්. පී. ඒ. කේ. ලංකා සමරකෝන් මිය, නො, 130 බී, යාලගල පාර, හොරණ.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ලූමියර් ටෙක්ස්ටයිල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, ලොට් 15, "ඒ" කොටස, බියගම අපනයන සැකසුම් කලාපය, වල්ගම, මල්වාන.

අතර පවත්නා 2022.05.31 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල් වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් නීතිඥ වීරකුට්ටි දියුණුගේ සරත් ජයරත්න වීරසිංහ මයා වෙත යොමු කරන ලදී.

බේරුම්කරු නීතිඥ වීරකුට්ටි දියුණුගේ සරත් ජයරත්න වීරසිංහ මයා ධුරයෙන් ඉල්ලා අස්වන බව දන්වා ඇත. එබැවින් යථෝක්ත නියෝගය, අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මා, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2022.06.08 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2023 ජනවාරි මස 05 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/01/2018/121.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල් වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

01. ඒ. එල්. විජේසුන්දර මයා, නො. 130 බී, යාලගල පාර, හොරණ.
02. එස්. පී. ඒ. කේ. ලංකා සමරකෝන් මිය, නො, 130 බී, යාලගල පාර, හොරණ.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ලූමියර් ටෙක්ස්ටයිල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, ලොට් 15, "ඒ" කොටස, බියගම අපනයන සැකසුම් කලාපය, වල්ගම, මල්වාන.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී

ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මත්තේගම, කුඩාමඩුව, ද විල්ලේජ් 202/බී/61, හි නීතිඥ විජේසූරිය ආරච්චිගේ ජයවික්‍රම මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2023 ජනවාරි මස 05 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/01/2018/121.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

01. ඒ. එල්. විජේසුන්දර මයා, නො. 130 බී, යාලගල පාර, හොරණ.
02. එස්. පී. ඒ. කේ. ලංකා සමරකෝන් මිය, නො, 130 බී, යාලගල පාර, හොරණ.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ලූමියර් ටෙක්ස්ටයිල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, ලොට් 15, "ඒ" කොටස, බියගම අපනයන සැකසුම් කලාපය, වල්ගම, මල්වාන.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,**

''ලූමියර් ටෙක්ස්ටයිල්ස් ලිමිටඩ් (පසු නම - ලූමියර් ටෙක්ස්ටයිල්ස් ප්‍රයිවට් ලිමිටඩ්) ආයතනයේ සේවය කරන ලද ඒ. එල්. විජේසුන්දර මහතා හට රියදුරු දීමනාව, ප්‍රවාහන දීමනාව හා ඉන්ධන දීමනා නොගෙවීම සහ එස්. පී. ඒ. කේ. ලංකා සමරකෝන් මිය හට ප්‍රවාහන දීමනාව, ඉන්ධන දීමනාව නොගෙවීම මගින් අසාධාරණයක් සිදුව තිබේ ද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔවුන් දෙදෙනාට හිමි විය යුතු සහන කවරේද? යන්න පිළිබඳව වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 01 – 0139

---

මගේ අංකය: IR/COM/01/2020/193.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2022.08.20 වන දින අංක 2293/71 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2022.08.15 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එස්. දිසානායක මයා, අංක 338/12, දෙවන පටුමඟ, රොබට් ගුණවර්ධන මාවත, මාලඹේ

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව, චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, තැ.පෙ. 2085, කොළඹ 02.

අතර පවත්නා 2022.08.09 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල් වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් නීතිඥ මලින්ත ජයසිංහ මයා වෙත යොමු කරන ලදී.

බේරුම්කරු නීතිඥ මලින්ත ජයසිංහ මයා ධුරයෙන් ඉල්ලා අස්වන බව දන්වා ඇත. එබැවින් යථෝක්ත නියෝගය, අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මා, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2022.08.15 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2023 ජනවාරි මස 05 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/01/2020/193.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල් වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එස්. දිසානායක මයා, අංක 338/12, දෙවන පටුමඟ, රොබට් ගුණවර්ධන මාවත, මාලඹේ

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව, චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, තැ.පෙ. 2085, කොළඹ 02.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මත්තේගම, කුඩාමඩුව, ද විලේජ් 202/බී/61, හි නීතිඥ විජේසූරිය ආරච්චිගේ ජයවික්‍රම මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2023 ජනවාරි මස 05 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/01/2020/193.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එස්. දිසානායක මයා, අංක 338/12, දෙවන පටුමග, රොබට් ගුණවර්ධන මාවත, මාලබේ

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව, විත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, තැ.පෙ. 2085, කොළඹ 02.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ සේවය කළ එස්. දිසානායක මහතාට 2010, 2011, 2012 යන වර්ෂවල අදාළ වැටුප් වර්ධක සහ ඊට අදාළ හිඟ මුදල් සඳහා හිමිකමක් තිබේ ද යන්නත් හිමිකමක් තිබේ නම් එය ලබා නොදීම තුළින් ඔහුට අසාධාරණයක් සිදුව තිබේ ද එසේ තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේ ද යන්නත් පිළිබඳවයි.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 ජනවාරි මස 03 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 01 – 0140

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.